# කුරුණෑගල නගරාසන්න ඓතිහාසික බම්බා විහාරයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

එම්.එච්.එම්.ඒ.ඒ. මල්විල

තෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*ayeshamalvila@gmail.com*

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඉඳුල්ගොඩ ග්‍රාමසේවා වසමේ තැම්පාන ජලාශය හා එම රක්ෂිත ප්‍රදේශය තුළ පැරණි ලෙන් විහාරයක් පිහිටා තිබේ. එම විහාරය හා තදාශ්‍රිත කලාපය හඳුනාගනිමින් එම විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ අධ්‍යයනය මෙහි මූලික අරමුණ වේ. මෙම ස්ථානය පිළිබඳ ව දැනට කර ඇති පූර්ව අධ්‍යයනයන් ඉතා ම අවම ප්‍රමාණයක පවතී. මෙම ස්ථානයේ ඇති පාරිසරික භූගෝලීය තත්ත්වය හඳුනාගැනීම, ඓතිහාසික පුරාවිද්‍යාත්මක පසුබිම හා පවතින වැදගත්කම අධ්‍යයනයට යොමු කෙරේ. මෙම කලාපයේ මුහුදු මට්ටමේ සිට අඩි 1000- 1200 අතර භූවිෂමතාවක් තුළ අඩි 700 කට වඩා උස්වූ කඳු පන්තියකට මැදි ව මෙම ස්ථානය පිහිටා ඇති අතර දේශගුණික තෙත් කලාපයකට අයත් අතර වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2000ට වැඩි ය. මෙම කලාපය ඉහළ ජෛව විවිධත්වයකින් යුතු අතර ආවේණික දුර්ලභ හා ඒකදේශික ශාක විශේෂ රාශියක් ද ක්ෂීරපායි, උරග, උභයජීවී හා පක්ෂීන් ඇතුළු සත්ත්ව විශේෂ ගණනාවක් ද මෙම පරිසරය තුළ හඳුනාගත හැකි වේ. මෙම රක්ෂිතය තුළ ස්වභාවික ජල මූලාශ්‍ර ටැම්පාන ජලාශයට ජලය සපයන ජල පෝෂකයන් වේ.

සංස්කෘතික උරුමයක් වශයෙන් ගත්කල හැඟීම්වල අගයයන්, සංස්කෘතික අගයයන් හා ව්‍යවහාරික අගයයන් හඳුනාගත හැකි ය. චිරස්ථායි අගය තුළින් මෙම උරුමය පෝෂණය වී ඇත. වළගම්බා රාජ්‍ය සමයේ පටන් වර්තමානය දක්වා ම වන්දනාමාන කෙරෙන ඉපැරණි සාධක මෙම විහාරය සතු වේ. කටාරමක් ද සහිත අතර තරමක් විශාල ලෙන් විහායේ මහනුවර යුගයේ චිත්‍ර ද හඳුනාගත හැකි වේ. වළගම්බා රජතුමා සැඟවී සිටි ස්ථානයක් ලෙස සැලකෙන මෙම ස්ථානයේ පසුකාලීන ව එතුමා විසින් මෙම විහාරය ඉදිකරවන ලදී (මහමිතව හිමි,2017). ලෙන් විහාරයේ කටාරම් කොටා ඇති අතර එයින් මෙහි සංඝයා වැඩ සිටි බවට හෙළි වේ. එකල ද මෙම ප්‍රදේශය ජනාවාස වී තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. ලෙන් විහාරය තුළ බුදුපිළිම තුනක් හා මහනුවර යුගයට අයත් ලෙන් චිත්‍ර හඳුනාගත හැකි ය. වර්තමානයේ දී චිත්‍ර

යම් දුර්වල සංරක්ෂණයකට බඳුන් වී ඇති අතර කුරුණෑගල නගරසභාව මඟින් මෙම කලාපය ආරක්ෂාකර පවත්වාගෙන යයි. එය දේශිය හා විදේශිය සංචාරකයින් උදෙසා විවෘත කරනු ලබන්නේ ඉතා සීමා සහිතව ය. මෙම විහාරය පුරාණයේ බම්බාගල නමින් හැඳින්විනි (මහමිතව හිමි, 2017). ලෙන් විහාරය පිටුපස දක්නට ලැබෙන උමගක රජතුමා සැඟවී සිටි බව පිළිගැනේ. විහාරයේ ඇති පැරණි ලෙන් විහාරය විහාරගෙය වේ. ජලාශයේ කෙළවරේ ජලාශය තුළට පෙරළී ඇත් ගල පන්සල්ගල නමින් හැඳින්වේ. මෙම ස්ථානයේ සංඝයා වහන්සේලා වැඩසිටි ආවාසගෙය තිබූ බවත් ජලාශය නිර්මාණය කිරිමේ දී එහි බැම්මට ස්තූපය මැදිකොට බැන්ද බවත් කියවේ. මෙම විහාරයේ එදා සිට අද දක්වා ම වන්දනාවට පාත්‍රවන බැවින් ක්‍රියාකාරිත්ව අගය පිළිබිඹු වේ.

වැම්පාන ජලාශය ආශ්‍රිත රක්ෂිතය තුළ පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් හඳුනාගත හැකි ය. ඒවා නම්,

1 ලෙන් විහාරය
2 උඩ ලෙන
3 පොකුණ
4 පන්සල් ගල
5 බණමඩුවේ වත්ත හා මල් ආසනය
6 හුළංබැද්ද ගල්ගේ
7 බුදුමේවත්ත ගල්ගේ
8 ගල් පාලම
9 ස්තූපය පිහිටි ස්ථානය හා අවශේෂ පුරාවස්තු
10 උළු සහ වළං කැබිලිති

1. ලෙන් විහාරය

වැවේ සිමාවේ සිට මීටර් 200 ක් පමණ ඊසාන දිගින් පිහිටන මෙම ලෙන් විහාරය සඳහා පිවිසීමට අලංකාර මාර්ගයක් ඇත. මෙම ලෙන් විහාරය වැවේ මට්ටමට වඩා මීටර් 10ක් පමණ උසින් පිහිටයි. යට විහාරය ලෙස සැලකෙන මෙහි පැරණි බිත්ති සහ දොර උළුවහු වෙනුවට අලුතින් බිත්ති බැඳ අලුත්වැඩියා කර තිබේ. විහාරය නිර්මාණය කර ඇති ලෙනේ පළල මීටර් 113ක් පමණ ද ගැඹුර මීටර් 42ක් පමණ ද ලෙන් විවරයේ උස මීටර් 3ක් පමණ ද වේ. මහනුවර යුගයට අයත් චිත්‍ර සහ ප්‍රතිමා රාශියකින් සමන්විත මෙහි ඉදිරිපස බිත්ති මැටිටෙන් බැද චන්ද්‍රවංකය සහිත උළුවස්සක් තබා තිබූ බවත් මීට වසර 30 කට පමණ පෙර මෙය වැටීමෙන් පසු නගර සභාව මඟින් එය නැවත තනා තිබේ.

2. උඩලෙන

කටාරමක් සහිත මෙම ලෙන දකුණු දිශානුගත ව පිහිටා තිබේ. ලෙන් විවරයේ පළල මීටර් 11ක් ද ගැඹුර මීටර් 8ක් ද ලෙන් පියස්සේ උස මීටර් 255ක් ද වේ. ලෙන් අවකාශය තුළ සක්කා ගලින් කළ පාදමක් දක්නට ලැබේ. (හේරත්, 2001) දකුණු දිශානුගතව පාදම මීටර් 5.90 කි. නැගෙනහිර බටහිර දිශානුගතව මීටර් 6.70 පමණ වන පාදමකි. එම පාදම බටහිර පසින් ස්වභාවික ගල්කුලකට සම්බන්ධ වී අවසන් වේ. ලෙන් පියස්සේ කටාරම මීටර් 14.5කි. උඩ විහාරය ලෙස සැලකෙන මෙහි මෑතක් වන තුරුම ලෙන් පියස්සේ චිත්‍ර තිබූ බව කියවේ.

### 3. පොකුණ

ජලාශයේ සීමාවේ සිට නැගෙනහිර දිශානුගත ව ලෙන් විහාරයට පිවිසීමට ඇති මාර්ගයේ මීටර් 40ක් පමණ ගිය තැන මෙම අලංකාර චතුරස්‍ර පොකුණ හමු වේ. ජනප්‍රවාදයට අනුව වළගම්බා රජු ස්නානය කළ පොකුණ ලෙසත් මෙහි වැඩ විසූ භික්ෂූන් වහන්සේලා පරිහරණය කළ පොකුණ ලෙසත් සඳහන් වේ. ඉතාමත් සැලසුම් සහගත ව සක්කා ගල් උපයෝගි කොටගෙන නිර්මාණය කර ඇති මෙම පොකුණ පත්ලට යනවිට ක්‍රමයෙන් කුඩා වේ (හේරත්,2001). පොකුණේ දිග මීටර් 12.20කි. පළල මීටර් 10.5කි. බැසීමට ඇති පියගැට පෙළක් හඳුනාගත නොහැකි ය. වයඹ දිශානුගත මුල්ලෙන් ජලය පිට කිරීම සඳහා වන සෙ.මී. 60ක පමණ පළලින් යුත් කාණුවකි. පොකුණ තුළ ජලය පල්වීම වැළැක්වීම සඳහා මෙය භාවිතා කරන්නට ඇත.

### 4.පන්සල් ගල

ජලාශයේ නැගෙනහිර සීමාවේ දක්නට ලැබෙන ගල් කුල පන්සල් ගල නමින් හැඳින්වේ. මෙම ස්ථානයේ පිහිටි විශාල ලෙන භික්ෂූන් වහන්සේලා වාසය කළ ආවාසගෙය ලෙස විශ්වාස කෙරේ. 1957 දී ඉහළ කන්ද නායයාම නිසා මෙම ලෙන වැව තුළට කඩා වැටුණු බවත් ගල්කුලු දෙක එකල එකට තිබූ බව කියවේ. වැටුණු ලෙනේ කටාරමක් සහිත ය. නැගෙනහිර ගල් කුලේ බිම් මට්ටමේ සිට මීටර් 2ක් පමණ කටාරම හඳුනාගත හැකි ය. කඩාවැටී ඇති ලෙන් පියස්සෙන් කොටසක් ගල් ලෙනේ ශේෂව ඇත. බහුලව උළු කැබලි හමුවන බැවින් ලෙන් පියස්සේ ඉදිරියට උළු සෙවිලි කළ පියස්සක් තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

### 5. බණමඩුවේ වත්ත සහ මල් ආසනය

වැව් බැම්මටත් මාර්ගයටත් බටහිරින් පිහිටි ඉඩමේ මල් ආසනය පිහිටා ඇත. මල් ආසනය ස්තූපයක් සඳහා බවත් එම ස්තූපය වැව බැඳීමේ දී ඊට යට වූ බවත් කියවේ. මෙම ආසනයේ බොරදම් රටාවක් හඳුනාගැනීමට ලැබේ.

### 6. හුළංබැද්ද ගල්ගේ

ටැම්පාන ජලාශයේ සිට මීටර් 250ක් පමණ උතුරු දිශාවෙන් මීටර් 200 පමණ ඉහළ සීමාවේ පිහිටා ඇති මෙම කටාරම් සහිත ලෙන ටැම්පාන රක්ෂිතයේ පිහිටා ඇත. යටත්විජිත යුගයේ දී රබර් වැවීම නිසා මාර්ග ඉදිකිරීමේ දී මෙම ලෙන අභ්‍යන්තරයෙන් මාර්ගයක් නිර්මාණය කර තිබේ. (හේරත්, 2001) මෙම ලෙන කොටස් දෙකකින් යුක්ත ය. පළමු ලෙනේ උතුරු දෙසට මාර්ගය වැටී ඇති කොටස ය. මෙම කොටසේ ඉදිරියෙන් ඇති ගල්කුල නිසා පියස්සක් නිර්මාණය වී පවතී. මෙහි කටාරමක් ද සහිත ය. පළමු ලෙනට නැගෙනහිරින් එම ගත් කුලට ම සම්බන්ධ ව දෙ වැනි ලෙන පිහිටා තිබේ. කටාරමක් සහිත ය.

### 7. බුදමේවත්ත ගල්ගේ

ටැම්පාන ජලාශයේ සිට මීටර් 600 ක් පමණ උතුරු දිශාවෙන් මෙම ලෙන පිහිටා ඇත. මෑත කාලය වන තුරු ම මෙහි භික්ෂූන් වාසය කර ඇත. ලෙන් බිමේ කුටියක් ඉදිකර ඇති අතර එහි මුල් ස්වරූපය වෙනස් ව ගොස් ඇත.

ලෙන් විවරය උතුරු දිශාවට පිහිටා ඇත.

### 8. ගල් පාලම

මෙම පාලම ලෙන් විහාරයට යන මාර්ගයේ ඇති අතර අනුරාධපුර යුගයට අයත් බව විශ්වාස කෙරේ. (හේරත්, 2001)

### 9. ස්තූපය පිහිටි ස්ථානය හා අවශේෂ පුරාවස්තු

ස්තූපය වැවට යට වී ඇති බව ගම්වැසියන්ගේ අදහස ය. වැව වටා ගොඩනගා ඇති පනාබැම්වල ඕවලාකාර ගල් කණු සිදුරු දක්නට ලැබෙන බැවින් වැව් බැම්ම සැකසීමේ දී කණු යොදාගෙන ඇත.

### 10. උළු හා වළං කැබිලිති

මෙහි ස්මාරක කිහිපයක් ආශ්‍රිත ව උළු හා වළං කැබිලිති හමු වී තිබේ. විශේෂයෙන් ම පන්සල් ගල හා අංක 2 ලෙනෙ බහුල ව හමුවේ. මහනුවර යුගයේ භික්ෂූන් සිටි බව පැවසෙතත් මෙහි හමුවන වළං සහ උලු කැබිලිති ඊට පෙර යුගයකට අයත් බව විශ්වාස කෙරේ. එම කැබිලිති පූජාවන් හා ආහාර පිසීමට භාවිත කෙරුණු බවට උපකල්පනය කළ හැකි ය.

## නිගමනය

මෙම ස්ථානයේ භාවනායෝගී භික්ෂූන් වාසය කළ බව හා ඊට නිස්කලංක පරිසරය හා දර්ශනීය භූමිය තුළ නිර්මිත කටාරම් කෙටූ ලෙන් මහෝපකාරී වී ඇත. ලෙන් ආශ්‍රිත ව ලැබෙන වළං කැබිලිති, පාත්‍ර කැබිලිති හැර විශේෂ සංස්කෘතික ටැම්පාන ජලාශය ආරම්භ කිරීමෙන් පසු මෙම පරිශ්‍රය රක්ෂිතයක් බවට පත් කරන ලදී. මෙම ස්ථානයේ ස්වභාවික හා සංස්කෘතික උරුමය අන්‍යෝන්‍ය වශයෙන් එකින් එකට බැඳී ඇති අතර මෙම ස්ථානය වටිනා පුරාවිද්‍යා ස්ථානයකි.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


හේරත්, චමින්ද. *ක්ෂේත්‍ර පුරාවිද්‍යා කෙටි නිබන්ධන එකතුව:* 2001, අප්‍රකාශිත.

**සම්මුඛ සාකච්ඡා**

**මහානාම, මහමිතව** ආරිය උපෝසථාරාමය,ඉඳුල්ගොඩකන්ද 2017.03.04, බම්බා විහාරයේ ඉතිහාසය.

**වීදාගම, සුනිල්.** පිලීකඩ, 2017.03.04, බම්බා විහාරයේ ඉතිහාසය පිළිබඳ සාකච්ඡාව.

**හේරත්, චමින්ද.** 2017.03.04, බම්බා විහාරයේ ඉතිහාසය හා පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳ සාකච්ඡාව.